

# අමා ගඟුල

මාසික ධර්ම දානය

2013

August 20

## පුනර්භවය ගැන සැලකිලිමත් වෙමු,

## එක් වන්න සත්‍ය දකින්න

ගෞරවනීය ස්වාමීන් වහන්ස,
කාරුණික පින්වතුනි,

**ගබ්භමෙකෙ උප්පජ්ජන්ති - නිරයං පාපකම්මිනො**
**සග්ගං සුගති නො යන්ති - පරිනිබ්බන්ති අනාසවා**

(ධම්ම පදය - පාපවග්ගය)

**"ඇතැම් කෙනෙක් මෙලොව ගැබක උපදිත්, පව්කල අය නිරයේ උපදිත්. පින්කල අය දෙව්ලොව උපදිත්. රහතන් වහන්සේලා පිරිනිවන් පාති"**

අද නිකිණි පුර පසළොස්වක පොහොය දිනයයි. පසුගිය ඇසළ පෝය දිනයෙහි පෙරවස් විසීමට නොහැකි වූ භික්ෂූන් වහන්සේලා පසුවස් සමාදන් වන්නේ අදින් එළඹෙන නිකිණි පුර පසලොස්වක පොහොය දිනයේය. සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවූ තැන මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පළමු සංගීතිය පැවැත්වීමට ආරම්භ කළේ අද වැනි පෝය දිනයකයි. ඒ වන විට රහත් නොවී සිටි ආනන්ද හිමියන්ගේ රහත්වීම සිදුවූයේ ද අද වැනි පොහොය දිනයකයි.

ශාසන ඉතිහාසය තුළ මෙවැනි වැදගත් සිදුවීම් සිදුවූ මෙවන් දිනයක අප බලාපොරොත්තු වන්නේ පුනර්භවය ගැන බුදු දහමේ එන පණිවිඩය සිහිපත් කරදීමටයි. කෙලෙස් සහිත අප හැමදෙනාටම ඊළඟ භවයකට යාමට සිදුවෙයි. ඒ ක්‍රියාදාමය හැඳින්වීම සඳහා අපි වචන දෙකක් භාවිත කරමු. පුනරුත්පත්තිය සහ පුනර්භවය යන එම වචන දෙකයි. මෙහි මුලින් දැක්වූ පුනරුත්පත්තිය යන්න අපට නොගැලපෙයි. එම වචනය සෑදී තිබෙන්නේ පුන+උපපත්ති යන වචන දෙකේ එකතුවෙනි. එහි එන උප්පත්ති යන ක්‍රියා පදයේ ධාතුව "පද්" ධාතුවයි. "පද්" ධාතුවෙන් යෑමක් ගැන කියවේ. එසේ කියවෙන කොට යන්නෙක් සිටිය යුතු වෙයි. යන්නේ කවුද කියා ඇසුවොත් ආත්මය යයි ආත්මවාදීන්ට පිළිතුරු දිය හැකිය. ඒ නිසා පුනරුත්පත්ති යන වචනය ආත්මවාදීන්ට ගැලපෙන වචනයකි. අපට ගැලපෙන වචනය පුනර්භවය යන්නයි. එහි අදහස නැවත වෙයි යන්නයි. එහි ධාතුව "භූ" ධාතුවයි. වෙයි යන ක්‍රියාපදය යෙදූ විට කවුද වෙන්නේ කියා ප්‍රශ්නයක් ඇති නොවෙයි. මෙලොවදී පුද්ගලයා කරනු ලබන කුසලා කුසල කර්ම හේතුවක් වී එයින් ලබන ඵලය පරලොව ලෙස දැක්විය හැක.

ඉහත කී ඊළඟ උපත පිළිබඳ ගැටලුව එදා මෙන්ම අදටත් ගැටලුවක් වී ඇත. එම

ගැටලුව නිරාකරණය කරගෙන මතු භවය අවසන් කිරීම අපේ යුතුකම හා වගකීම විය යුතුයි. වෙනදාට වඩා වස් කාලය වෙන් වන්නේ අපේ ආගමික ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහායි. එහි අවසාන ප්‍රතිඵලය විය යුත්තේ උපාදාන නැතිකොට ලබන පිරිනිවන් පෑමයි. පිරිනිවන් පෑ බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කලේ ලෝවැසි සියළු සත්වයින් පිරිනිවනට පත්කරලීමටයි.

ඉහත සඳහන් කළ ඊළඟ උපත පිළිබඳ ගැටලුව නිරාකරණය කර ගත හැකි ධම්මපදයේ පාප වග්ගයේ එන ගාථා ධර්මයක් විවරණය කරදීම මෙම සදහම් පණිවිඩයේ අරමුණයි. සැවැත්නුවරට නුදුරු ස්ථානයක සැදැහැවත් මැණික් කපන පුරුෂයෙක් ජීවත් විය. ඔහුගේ බිරිඳ සහ දරුවෝද සැදැහැවත් ය. මේ ගෙදරට නිතර වැඩම කරන තිස්ස නම් මහරහතන් වහන්සේ නමක් විය. අවුරුදු 12ක් ඒ පවුල සමග කුලූපගව ජීවත් වූ නිසා ඒ මහරහතන් වහන්සේ මණිකාර කුලූපගතිස්ස යන නමින් හැඳින්වූහ.

මෙම රහතන් වහන්සේ මැණික් කරුගේ ගේ තුල වැඩ සිටින දවසක මැණික්කරු මස් කපමින් සිටියහ. මේ අතර කොසොල් මහරජු ඇමතියෙකු අත ඔපනගා ගැනීම සඳහා මැණිකක් එව්ය. ඒ මැණික අගනා මැණිකකි. මැණික්කරු ලේ තැවරුණු අතින්ම මැණික ගෙන පසෙකින් තබා අත් සෝදා ගැනීමට ගියහ. ඒ ගෙදර වාසය කළ කොස්වාලිහිණියෙක් ලේ තැවරුණු මැණික දැක මස් කැටියකැයි සිතා ගිල දැමූහ. එම රහතන් වහන්සේ මේ කාරණය දුටහ. මැණික් කරු ඇවිත් මැණික නොදැක තම ස්වාමි දියණියගෙන් හා දරුවන්ගෙන් අසා ඔවුන් කිසිවෙක් නොගත් බව කී විට එම තෙරුන්වහන්සේ කෙරෙහි සැක කළහ. මේ මැණික ඔබ වහන්සේ ගත්තේදැයි ඇසූවිට නැතැයි පිළිතුරු දුන්හ. නමුත් මැණික් කරු සිතුවේ මේ තෙරුන් වහන්සේ ඒ මැණික සොරකම් කළ බවයි. තම ස්වාමි දියණිය කොතෙක් එපා කීවත් ඒ ගැන නොසලකා තෙරුන්වහන්සේට වධහිංසා කලේය. තෙරුන්වහන්සේගේ හිස ලණුපොටකින් වෙලා ලියකින් තිරිංගයක් දමා හිස මිරිකූහ. තෙරුන්වහන්සේගේ නාසා වලින් ලේ වැගිරෙන්නට පටන්ගත්හ. බිමට වැටුනු ලේ දැක ඉහත කී කොස්වාලිහිණියා එතනට පැමිණියහ. කෝපයෙන් රත්ව සිටි මැණික්කරු කොස්වාලිහිණියාට තදින් පා පහරක් ගැසීය. කොස්වාලිහිණියා එතනම මැරී වැටුණේය. තෙරුන්වහන්සේ කොස්වාලිහිණියා මළ බව දැන වේදනා සහිතව ම සිඳගෙන ලේ තැවරුන මැණික ගිල දැමුවේ කොස්වාලිහිණියා බව පැවසීය. මැණික්කරු ලිහිණියාගේ බඩ පලා මැණික දැක මහත් දොම්නසට පත්විය. මැණික්කරු හඬමින් වැළපෙමින් වහාම බැමි ලිහා දමා තෙරුන්වහන්සේගෙන් සමාව ඉල්විය. තෙරුන්වහන්සේද එම බලවත් වේදනාව නිසා නොබෝ දිනකින් පිරිනිවන් පෑහ.

මේ සිද්ධිය දැනගත් භික්ෂූන් වහන්සේලා බුදුන්වහන්සේ වෙත එළඹ මේ අය ඊළඟට උපත ලැබුවේ කොහිදැයි ප්‍රශ්න කලහ. කොස්වාලිහිණියා මැණික්කරුගේ බිරිඳ කුස පිළිසිඳ ගත් බවද, තෙරුන්ට වධහිංසා කල මැණික්කරු නිරයේ උපන් බවද, ඔහුගේ බිරිඳ 12 අවුරුද්දක් තෙරුන්වහන්සේට උවටැන් කිරීම සහ අන්තිම මෙහොතේදීත් සැක නොකල නිසා දිව්‍යලෝකයේද, තෙරුන්වහන්සේ කෙලෙස් නැති කොට සිටි නිසා පිරිනිවන් පෑ බවද දක්වා ඉහත කී ගාථාව දේශනා කළ සේක.

ධම්ම පදයේ පාප වර්ගයෙහි එන මෙම ගාථාවෙන් පුනර්භවය පිළිබඳ වැදගත් සන්නිවේදනයක් ඉදිරිපත් කරයි. මෙම අදහස් වලට අනුව ඊළඟ උපතක් ගැන විශ්වාස කරන අප සියළුම දෙනා කළ යුත්තේ එම උපත නැති කර ගැනීම සඳහා ක්‍රියාත්මක වීමයි. විශේෂයෙන්ම වස්කාලය තුල භික්ෂූන් වහන්සේලා ශික්ෂාකාමීව කටයුතු කරන්නේත්, වෙනදාට වඩා විහාරස්ථානයට ලංවෙමින් ගිහි ජනතාව පින් දහම් සිදු කරන්නේත් මේ

පුනර්භවය නම් වූ ඊළඟ උපත නැති කර ගැනීම සඳහායි.

ඉහත කී කථාවට අනුව කෙලෙස් සහිත සත්වයෙකු වූ කොස්වාලිහිණියා මැණික් කරුගේ බිරිඳගේ කුසෙහි උපත ලැබූහ. කෙලෙස් සහිත අප සියළු දෙනාත් එසේ මව් කුසක උපත ලද යුතුයි. නමුත් අපේ අපේක්ෂාව විය යුත්තේ එසේ නැවත ගැබක නොහිඳන තත්වයට පත්වීමයි. අප බොහෝ දෙනාට පාඩම් තිබෙන කරණීයමෙත්ත සූත්‍රයේ අවසානයේදී මෙවැනි අදහසක් ඉදිරිපත් කරයි. දෘෂ්ටිවලට නොපැමිණ සිල්වත් පුද්ගලයා දර්ශනයෙන් යුක්තව ක්‍රියා කරයි. ඔහු කාමයන්ගෙන් වෙන් වී නැවත ගැබක නොහිඳන තත්වයට පත්වේ.

"දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනෙන සම්පන්නො කාමෙසු විනෙය්‍ය ගෙධං නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතීති."

මෙහි දිට්ඨි යනු තම තමාගේ මනස තුල මමත්වය නිසා ඇතිවන අදහස්ය. පුනර්භවය ඇති කරන ප්‍රධාන සාධකය ලෙස බුදුදහම උගන්වන්නේ තණ්හාවයි. එම තණ්හාව තෙවදෑරුම් කොට දක්වා තිබේ. මේ කාරණා 3 තුලම පවතින්නේ මමත්වය සතුටු කර ගැනීම සඳහා ඇති වැඩපිළිවෙළකි. ඒ සියළු දේ දෘෂ්ටීන් ලෙස දැක්විය හැක.

කාම තණ්හා යනු අපේ ඇස ආදී ඉඳුරන් සතුටු කර ගැනීමේ වැඩපිළිවෙලයි. ඉඳුරන් මගින් බාහිර ලෝකය දෙස බලා අපි සඤ්ඤා හෙවත් හඳුනාගැනීම් ඇති කරගනිමු. එම සඤ්ඤා හොඳ නම් අපි හොඳ වේදනාවන් ලබා ගෙන එම අරමුණු වල ඇලෙමු. ඒවා තමා සතු කර ගැනීමට කටයුතු කරමු. එම සඤ්ඤා නරක නම් අපි අසතුටු වෙමු. ඒ අරමුණු සමග ගැටෙමු. මෙම ඇලීම සහ ගැටීම ඇති වූ විට අප තුළ දෘෂ්ඨි ඇතිවේ. එම දෘෂ්ඨි පදනම් කරගෙන අපි අපේ සසර දිගු කර ගනිමු. සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තිය නම්වූ නිවනට පත්වූ පුද්ගලයා එම සියළු සඤ්ඤා හෙවත් හඳුනාගැනීම් දෙස උපේක්‍ෂාවෙන් බලයි. කරණීයමෙත්ත සූත්‍රයෙහි දස්සන යන වචනයෙන් උගන්වා ඇත්තේ එම උපේක්‍ෂා සහගත ආකල්ප යයි. මෙසේ අන්තවාදී දෘෂ්ටිවලින් මිදී ක්‍රියාකලහොත් නැවත මව්කුසක නොහිඳන තත්වයට පත්විය හැකියි.

භව තණ්හා යනු ඊළඟට උපදින තැන සැපවත් තැනක් කරගැනීමේ ආශාවයි. සමහරු දිව්‍ය ලෝක වලට යෑමටත් නැවත මිනිස් ලෝකයට ඒමටත් ආශා කරන්නේ ඊළඟ බවයේදීත් මම නැමැති පුද්ගලයා සතුටු කර ගැනීමේ ආශාවෙනි. එම භව තණ්හාවත් සසර දිගු කරන දෘෂ්ටියකි.

විභව තණ්හා යනු උච්ඡේද දෘෂ්ටියයි. ඊළඟට භවයක් නැත. ඇත්තේ මේ භවය පමණි. ඒ නිසා හැකි හැම ක්‍රමයකින්ම මම නැමැති පුද්ගලයා සතුටු කරගත යුතුයි. නාස්තිකවාදයක් ඉදිරිපත් කල අජිත කේෂකම්බල ආචාර්යවරයා වෛදික ආගම් වලින් ඉදිරිපත් කල සියළු වැඩපිළිවෙල ප්‍රතික්ෂේප කරමින් කියා සිටියේ ජීවත්ව සිටිනා තුරු සිරුරට උපරිම ලෙසින් සැප දිය යුතුයි. මැරුණු පුද්ගලයා නැවත ඉපදීමක් නැති බවයි. මමත්වය පෙරදැරිකරගෙන ඇතිකරගත් මෙම විභව තණ්හාව නම් දෘෂ්ටියෙන්ද සිදු වන්නේ සසර දිගු වීමකි. මේ කියන ලද තෙවැදෑරුම් තෘෂ්ණාව ඇති කල්හි ගැබක ඉපදීම සිදුවේ. එම තත්වය නැතිකරලීමට නම් තෙවැදෑරුම් තණ්හාව නැති කළ යුතුය.

මෙම ගාථාවට අනුව පව්කල තැනැත්තා අපාගත වෙයි. මණිකාර කුලූපගතිස්ස

හිමියන්ගේ ගුණය හඳුනානොගත් මැණික්කරුවා අපාගත වූ බව කියයි. සත්වයාගේ පුනර්භවය සිදුවන මේ අපාය 4 බව සඳහන් කර තිබේ. නරකය, තිරිසන් යෝනිය, ප්‍රේත නිකාය, අසුරනිකාය වශයෙනි. මෙහි මුලට දැක්වූ නරකය කොටස් අටකින් දක්වා තිබේ. සංජීවය, කාලසූත්‍රය, සංඝාතය, රෞරවය, මහා රෞරවය, තාපය, ප්‍රතාපය, අවීචිය වශයෙනි. අපේ සාමාන්‍ය ඇසට නොපෙනෙන ස්ථාන ලෙස මේවා දැක්විය හැක.

මෙම කථාවෙහි එන මැණික් කරුවාගේ ස්වාමි දියණිය පින් කරගත් කාන්තාවක් නිසා ඇය දෙව්ලොවට ගිය බව කියයි. දිව්‍යලෝක ගැන සඳහන් කරන විට චාතුර්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිර්මාණරතිය, පරනිර්මිත වසවර්තිය යනුවෙන් ස්ථාන 6ක් දක්වා ඇත. ඉහත කී සතර අපාය සහ දිව්‍යලෝක 6 ගැන බොහෝ දෙනා සැක පහළ කරති. සාමාන්‍ය ඇසට හසුනොවන නිසා එසේ ප්‍රකාශ කලත් මේ දේශනාවන් පවත්වා තිබෙන ගෞතම බුදුන් වහන්සේ දේශනා කොට ඇත්තේ එවැනි දුගති භූමි සහ සුගති භූමි ඇති බවයි. සාමාන්‍ය කෙනෙකුගෙන් ඉරවල් කීයක් තිබේද? සඳවල් කීයක් තිබේද? කියා ඇසුවහොත් දෙන පිළිතුර එකයි කියයි. නමුත් අද විද්‍යාව දියුණු වී තිබෙන මේ යුගයෙහි රේඩියෝ, දුරදක්න වලින් බැලූ විද්‍යාඥයින් කියන්නේ ඉරවල් කෝටි ගාණක්, සඳවල් කෝටි ගාණක් ඇති බවයි. නමුත් බුදුරජාණන් වහන්සේ විශ්වය පිළිබඳ කරන ලද මෙම දේශනා කලේ තම මනස දියුණු කර ගැනීමේ ප්‍රතිඵල හැටියටයි. විශ්වය ගැන එදා බුදුන්වහන්සේ කළ දේශනා ගැන අද බොහෝදෙනා පුදුමයට පත් වෙති. ඒ නිසා සතර අපාය සහ දිව්‍ය ලෝක 6 ගැන කිසිවෙක් සැක කල යුතු නැත. ඒවා පුනර්භවය ඇති කරවන දුගති හා සුගති භූමින්ය. අප කල යුත්තේ පව් නොකොට සතර අපායට නොගොස් සිටීමයි. පින් කිරීමෙන් දෙව්ලොව යා හැකිය. නමුත් එයද සසර දික්කර ගැනීමකි. ඒ නිසා සියලු ආශාවන් නැති කොට නැවත ගැබක නොනිදන තත්වයට පත් විය යුතුයි.

මෙම ගාථාවට අනුව මැණික් කරුවාගේ තාඩන පීඩන වලට ලක්ව ජීවිතය අවසන් කළ මණිකාර කුලූපගතිස්ස හිමියන් පිරිණිවන් පා වදාලු සේක. සාරාසංකල්ප ලක්ෂයක් පාරමී දම් පිරූ අප මහ බෝසතාණන් වහන්සේ තම ජීවිතය ක්‍රමානුකූල බවට පත්කරගෙන මමත්වය සහමුලින්ම නැති කල සේක. අන්තිම ආත්ම භාවයේදී සිදුහත් කුමරු ලෙස උපත ලද අවස්ථාවේදී ප්‍රකාශ කලේ මම ලොවට අග්‍ර වෙමි, ජ්‍යෙෂ්ඨ වෙමි, ශ්‍රේෂ්ඨ වෙමි, මේ මාගේ අන්තිම ජාතියයි. නැවත මාගේ ඉපදීමක් නැත. " අයමන්ති මා ජාති නත්ථිදානි පුනබ්භවෝ". මෙම ගාථාවට අනුව අන්තිමට ප්‍රකාශ කරන්නේ කෙලෙස් රහිත රහතන් වහන්සේලා පිරිනිවන් පාන බවයි. පිරිනිවන් පා වදාළ බුදුරජාණන් වහන්සේ ලෝකයා අතෘප්තිකර ආශාවන්ට වහල්වී තණ්හාව ඉදිරියෙහි දාසයෙකු බවට පත් වෙයි. එම දාසයා මේ දිග සසරේ අපමණ දුක් විඳිමින් ජීවත් වෙයි. අපටත් එසේ උනොත් මේ ලැබූ බෞද්ධකමින් ප්‍රයෝජනයක් නැත. ඒ නිසා මේ වස් කාලය තුල සිහිනුවණින් කටයුතු කොට ගිහි පැවිදි අපි හැමදෙනාම පුනර්භවය නැති කොට සසර අවසන් කර ගැනීමට උත්සාහ දරමු. බෞද්ධයකු විමේ අග්‍රඵලය එයයි.

*තෙරුවන් සරණයි... !*